# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1956/8 - 2016 පෙබරවාරි මස 29 වැනි සඳුදා - 2016.02.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ව්‍යවස්ථාපිත නිශ්චය අංකය :-

විශේෂ්‍ය අංකය :- කො/2976

### 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය

ගම්පහ, බෞද්ධාලෝක මාවතේ, අංක 59 දරන ස්ථානයෙහි පදිංචි චන්ද්‍රසේන රත්නසිංහ මහතා විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව මෙම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම්වලින් ඔහුට තබා ගැනීමට ඉඩ දිය යුතු කොටස නිශ්චය කරමින් ඔහු මේ වන විට මියගොස් ඇති බැවින් ඔහුගේ බූදලයට ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි පහත උපලේඛනයෙහි දැක්වේ.

ටී. එච්. සුමනතිස්ස තාඹුගල,  
සභාපති,  
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2016 ජනවාරි මස 29 වැනි දින,  
කොළඹ 07,  
හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ, අංක සී 82 හි,  
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

01. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ කපුගම්පොත යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන පිඹුරු අංක 353 අතිරේක අංක 02 හි දැක්වෙන නවරත්න මුලන නැමති කුඹුරු ඉඩමෙහි අක්කර 14. රූඩ් 02 පර්චස් 00 ප්‍රමාණය ඇති අංක 25 දරන බිම් කැබැල්ල ද,


1A - G 23081 — 16 (2016/02)



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ කටුගම්පොත යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 353 අතිරේක අංක 3 හි දැක්වෙන නවරත්න මුලන නැමති කුඹුරු ඉඩමෙහි අක්කර 10. රූඩ් 00 පර්චස් 39ක ප්‍රමාණය ඇති අංක 28 දරන බිම් කැබැල්ල ද,

03. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ මුල්ගිරිගල යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 241 අතිරේක අංක 10 හි දැක්වෙන බර්ජන්කැලේ වත්ත නැමති ඉඩමෙහි අක්කර 19 රූඩ් 03 පර්චස් 27 ප්‍රමාණය ඇති කැබලි අංක 321 දරන බිම් කැබැල්ල හා එහි තුළ පිහිටි ගහකොළ පලතුරු හා ගොඩනැගිලි ද,

04. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ පල්ලත්තර යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 263 අතිරේක අංක 24 හි දැක්වෙන ආතුබෝදගේ වත්ත, තෙළඹුගහ කොරටුව හා විදානෙගේ කොරටුව නොහොත් විදානෙගේ වත්ත නැමති ඉඩමෙහි අක්කර 00 රූඩ් 01 පර්චස් 31 ක ප්‍රමාණය ඇති අංක 556 දරන බිම් කැබැල්ල හා එහි තුළ පිහිටි ගහකොළ පලතුරු හා ගොඩනැගිලි ද,

05. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ පල්ලත්තර යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 263 අතිරේක අංක 24 හි දැක්වෙන ගන්ඉමේහේන නැමති ඉඩමෙහි අක්කර 01 රූඩ් 01 පර්චස් 02 ප්‍රමාණය ඇති අංක 559 දරන බිම් කැබැල්ල හා එහි තුළ පිහිටි ගහකොළ පලතුරු හා ගොඩනැගිලි ද,

06. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ පල්ලත්තර යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 263 හි අතිරේක අංක 24 හි දැක්වෙන අත්කුඩාගේ ආර නොහොත් කිවුල්ආර නැමති ඉඩමෙහි අක්කර 00 රූඩ් 00 පර්චස් 20 ප්‍රමාණය ඇති අංක 560 දරන බිම් කැබැල්ල හා එහි තුළ පිහිටි ගහකොළ පලතුරු හා ගොඩනැගිලි ද,

07. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ පල්ලත්තර යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 263 අතිරේක අංක 18 හි දැක්වෙන පැනිවැලිහේන නැමති ඉඩමෙහි අක්කර 03 රූඩ් 01 පර්චස් 00 ප්‍රමාණය ඇති අංක 539 දරන බිම් කැබැල්ල හා එහි තුළ පිහිටි ගහකොළ පලතුරු හා ගොඩනැගිලි ද වේ.

03 - 381

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.